## 2.14 ධාතුවංසයෙන් හෙළිවන රුහුණේ ඉතිහාසය පිළිබඳ විමර්ශනයක්

ඒ එච්. එම් එච්. අබයරත්න
ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට ඇති බොහෝ වංසකථා මූලාශ්‍රය අතුරින්, ප්‍රාදේශීය වංසකථා මූලාශ්‍රයක් ලෙස ධාතුවංසයට හිමිවන ස්ථානය පරීක්ෂාකර බැලීමත්, මෙම කෘතියේ අන්තර්ගත සුවිශේෂ ඓතිහාසික තොරතුරු විමර්ශනය කිරීමත් ය.

ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේදී මහාවංසය, දීපවංසය වැනි ප්‍රධාන වංසකථා රාශියක් උපකාරී වන අතර ඒවායින් සමස්ත ශ්‍රී ලංකාවට අදාළ ඓතිහාසික තොරතුරු ලබාගත හැකි ය. එසේ වුව ද පාලි ධාතුවංසය නැතහොත් නලාට ධාතුවංසය කිසියම් ප්‍රදේශයක එනම් රෝහණ ප්‍රදේශයේ ඉතිහාසය ඉදිරිපත් කරන මූලාශ්‍රයක් වීම බෙහෙවින් ම වැදගත් වන්නේ ප්‍රධාන මූලාශ්‍රයවලින් ලබාගත නොහැකි වැදගත් තොරතුරු රැසක් අනාවරණය කරගත හැකි බැවිනි.

පාලි ගද්‍ය පද්‍ය මිශ්‍ර චම්පු කාව්‍ය ලක්ෂණ සහිත ධාතුවංසය රෝහණ රාජ්‍යයේ ආරම්භය සහ එහි ව්‍යාප්තිය පිළිබඳව වෙනත් කිසිදු මූලාශ්‍රයකින් නොලැබෙන ඓතිහාසික තොරතුරු සමුදායක් ඉදිරිපත් කරන අතර, ඒවායේ ඓතිහාසික අගය ඉහළ මට්ටමක පවතින බව, රුහුණේ බෝවත්තේගල ඇතුළු ස්ථාන කීපයකින් ලැබී ඇති අභිලේඛන ඇසුරින් පැහැදිලි වේ. ඊට අමතරව, මහාවංසයේ උත්කර්ෂවත්ව දැක්වෙන දුටුගැමුණු රජුගේ විජයග්‍රහණය පිළිබඳ සවිස්තරාත්මක වර්ණනාවල අන්තර්ගත නොවන, එසේ වුවත් එම ජයග්‍රහණයේ පදනම දැමූ පාලකයා ලෙසට නිසැකව ම හඳුනාගත හැකි කාකවණ්ණතිස්ස රජුගේ කාර්යභාර්ය පිළිබඳව බෙහෙවින්ම වැදගත් ඓතිහාසික කරුණු ධාතුවංසයෙන් ලබාගත හැකි ය.

මෙම පර්යේෂණයේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය වූයේ පාලිධාතුවංසය සහ සිංහල ධාතුවංසයත්, එමෙන්ම පාලිධාතුවංසය සහ වෙනත් වසංකථාත් තුලනාත්මකව විමර්ශනය කිරීම මගින් ධාතුවංසයේ දැක්වෙන විශේෂ තොරතුරු හඳුනාගැනීම ය.